## ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ ජනතා සමුළුව

### ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ ජනතා සමුළුවක් අවශ්‍ය වන්නේ ඇයි ?

යටත් විජිත සමයේ පසුභාගයේ සිට පත්වූ විවිධ රජයන්ගේ උවමනාවන් මත පදනම්ව ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් ගන්නා ලද තීන්දු රට තුළ දැවැන්ත දේශපාලනික හා සමාජීය අර්බුදයන් ඇති කර තිබේ. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ද ඇතුළුව විවිධ පාර්ශව විසින් යළි යළිත් කළ ඉල්ලීම් තිබියදී පවා ඉඩම් පිළිබඳ 'ජාතික ප්‍රතිපත්තියක්' සම්පාදනය තවදුරටත් සිහිනයක් පමණක් වේ. එනමුත්, මෙහි පහතින් තවදුරටත් විස්තර කර ඇති පරිදි ඉඩම් පරිපාලනය සම්බන්ධ නීති හා විධායක තීන්දු පාලක පන්තියේ දේශපාලන හා ආර්ථික උවමනාවන් ඉටු කරුනීම සඳහා මේ දක්වා යොමු වී ඇති බව පැහැදිලිය.

එක් අතකින් මෙම තීන්දු රටේ දේශපාලනික හා ආර්ථික සම්බන්ධතාවල මහා පරිමාණ පරිවර්තනයක් අරමුණු කරගත්තක් විය. යටත් විජිත සමයේ දී වැවිලි කර්මාන්තය සංවර්ධනයේ සිට නිදහස ලැබුණු පසු මහාපරිමාණ වාරි යෝජනා ක්‍රම හරහා වියළි කළාපයේ ජනපද ඇතිකිරීම ද, වඩාත් මෑතකාලීනව සිදුකරන්නට යෙදුනු බස්නාහිර පළාත් මහනගර සංවර්ධන කටයුතු දක්වා මීට ඇතුළත්වන දෑ බොහෝ ය. අනෙත් අතට, ශ්‍රී ලංකාවේ ඉඩම් සම්බන්ධ ව්‍යවස්ථාදායක සහ විධායක පාලනය යුද්ධය හා වාර්ගික ගැටුම, ස්වාභාවික විපත් මෙන්ම පාරිසරික අර්බුද සමගින් බැඳී පවතියි. මේ සියල්ල එකට යා කෙරෙමින් දිවෙන හුය වන්නේ රාජ්‍යය හා වෙළෙඳපොල බලවේග අතර පවතින බලහුවමාරුව වේ.

### අරමුණු

ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ ජනතා සම්මේලනය යනු ශ්‍රී ලංකාවේ ඉඩම් අයිතිය සඳහා ජනතාව තුළින් ගොඩනැගෙන්නා වූ අරගල සහ විග්‍රහයන් ඒකරාශී කිරීමට දැරූ වෑයමක් වේ. සමාජමය වශයෙන් සාධාරණවූත්, ආර්ථික වශයෙන් යුක්තිසහගතවූත්, පාරිසරික වශයෙන් තිරසාර වූත් දිශා වෙත ඉඩම් සම්බන්ධ ප්‍රතිපත්තිය යොමුකරවමින් එය යළි හැඩගැස්ම සඳහා වන අවශ්‍යතාවයෙන් පොළඹවන ලද වෑයමක් ලෙස මෙය හැඳින්විය හැකි ය. මෑතකාලීනව ඉඩම් පාදක කරගනිමින් රටතුළ නිර්මාණය වූ බොහෝ ගැටුම්, අරගල සහ විරෝධතා තුළින් නීතියේ සහ ප්‍රතිපත්තිවල එවන් යළි හැඩගැස්මක අවශ්‍යතාව දැඩිසේ අවධාරණය කරනු ලබයි. එසේම, ඉඩම් අයිතිය සම්බන්ධයෙන් ගොඩනැගෙන අරගල අතර සහයෝගීතාවය හා අවබෝධය වඩාත් තීව්‍ර කරගැනීමටත් හැකි වේදිකාවක් වශයෙන් ද මෙම ජනතා සම්මේලනය ඵලදායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙහි දෙවන ප්‍රධානතම අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා මහජනයාට ඇති අයිතිය ආරක්ෂා කරන්නා වූ පුලුල් නීති හා ප්‍රතිපත්ති යෝජනා මාලාවක් සම්පාදනය කිරීම පිණිස ගොඩනැගෙන මහජන සහභාගීත්ව ක්‍රියාවලියකට මුල පිරීමයි. මහජනතාව සැලකිලිමත්වන කරුණු දිගින්දිගටම රාජ්‍ය ප්‍රතිපත්තිවලින් බැහැර කිරීමේ තත්වය තුළ මෙය නොපමාව කළයුතු කාර්යයක් බවට පත්ව ඇති අතර මේ සම්බන්ධයෙන් නායකත්වය ගැනීමට පුරවැසි ව්‍යාපාරයක් අවශ්‍ය වී තිබේ. මෙම ජනතා ක්‍රියාවලිය ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන, පර්යේෂකයින් හා වියතුන්, නීතිඥයින් හා අනෙකුත් වෘත්තිකයින් ඒකාරාශී කරගෙන නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් දැනට කර ඇති යෝජනා වඩාත් ශක්තිමත් කිරීමටත් නව යෝජනා සම්පාදනය කිරීමටත් හේතු පාදක වන්නාවූ සාමුහික බලපෑම් මූල ලක්ෂයක් බවට පත්වනු අතැයි අපේක්ෂා කෙරේ.

### පසුබිම

ශ්‍රී ලංකාවේ සමාජ දේශපාලනික සංදර්භය තුළ ඉඩම් යනු කිසිවිටකත් ආර්ථික හෝ ජීවනෝපාය සම්පතක් ලෙස පමණක් සලකනු නොලැබේ. ඒ වෙනුවට එය ගරුත්වයට සහ අනන්‍යතාවයට වැදගත්වන අංගයක් ලෙස සලකනු ලැබේ. තවද, බොහෝ අවස්ථාවල ඉඩම් සාමුහික සම්පතක් ද වේ. එසේම, ශ්‍රී ලංකාව තුළ ඉඩම් කරා ප්‍රවේශ හැකියාව සහ ඉඩම් පරිහරණය සම්බන්ධ

අයිතිවාසිකම් ස්ත්‍රීපුරුෂ භාවය/ ස්ත්‍රීපුරුෂ සමාජභාවය, කුලය, පන්තිය සහ වාර්ගික-ආගමික අනන්‍යතාවලට අදාළ සමාජ සබඳතා තුළින් ඉස්මතුවන විභේදන රේඛා තුළ ද ගැබ්ව තිබේ.

යුද්ධයේ ආර්ථික දේශපාලනික බලපෑම (නෙරපාහැරීම/ අවතැන්වීම සහ යළි පදිංචි කිරීම/ ආපසු යාම ඇතුළුව), යටත්විජිත සමයේ හා ඉන්පසුව පැවති නීති හා ඉඩම් පාලන ක්‍රමවේද, සහ නිවාස ඉදිකිරීමේ සිට කෘෂිකර්මය දක්වාත් වතුකරය හා නාගරික ප්‍රදේශ සංවර්ධනය දක්වාත් පුළුල් පරාසයක විහිදෙන සමාජ හා ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති ද ඉඩම් කරා ජනතාවගේ ප්‍රවේශය සීමාකිරීමට හේතු වී තිබේ. පරිසරය සංරක්ෂණය කිරීම සහ පුරාවිද්‍යාත්මක උරුමය සුරැකීම සඳහා දරන වෑයම් ද මෙම අභියෝගයට ඇතුළත් වේ.

ආරක්ෂක හේතූන් මත ඉඩම් රඳවා තබා ගැනීම් තවදුරටත් සිදුවන තත්වයක් තුළ යම් යම් වෙනස්කම් සිදුව ඇතත් යුද්ධයෙන් පසු රටේ ඉඩම් අයිතිය සම්බන්ධ තත්වය බරපතළ පරිවර්තනයකට භාජනය වී නොමැත. උතුරේ හා නැගෙනහිර බොහෝ ප්‍රජාවෝ තවමත් අවතැන් තත්වයේ පසුවෙති. තම ගම්බිම් බලා ආපසුයාම/ යළි පදිංචි කිරීම සම්බන්ධයෙන් උද්ගතවූ ගැටළු, වාර්ගික ගැටළු වශයෙන් නිර්වචනය කිරීමට දරන වෑයම තවමත් ආමන්ත්‍රණය කිරීමට ලක්ව නොමැත. හමුදාව සහ අනෙකුත් හවුල්කාර පාර්ශව විසින් ඉඩම් අත්කරගැනීම ඉඩම් පාලනයේ සාධාරණබව හා යුක්තිසහගතබව සහතික කිරීම සඳහා අභියෝගයක් එල්ල කරයි.

මේ අතර, එක් අතකින් ඉඩම් විරහිතභාවය සහ කුලය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා වාර්ගික සබඳතා අතර ඇති අන්තර්ඡේදනය ද අනෙක් අතින් ඉතා බරපතළ දුර්වලතා සහිත ආර්ථික හා කෘෂි ප්‍රතිපත්ති ද හේතුවෙන් දිවයින මුළුල්ලේම ඉඩම් සඳහා වන ප්‍රවේශයට අදාළව සැලකිල්ල යොමුකළයුතු කරුණු තවදුරටත් උග්‍ර කරවා තිබේ. යුද්ධයේ අවසන් භාගයේදී සහ යුද්ධය අවසන් වූ පසුව බලයට පත්වූ විවිධ රජයන්ගේ ආර්ථික න්‍යායපත්‍ර තුළ ඉඩම් භාණ්ඩයක් ලෙස සලකනු ලබන අන්දමේ ප්‍රතිපත්ති වැඩි වැඩියෙන් දක්නට ලැබේ. එය, අපනයනය දිශානත කරගත් කෘෂිකර්මාන්තය වේවා, සංචාරක කර්මාන්තය වේවා, එසේත් නැතිනම් ඉඩම් සංවර්ධනය වේවා වෙනසක් වී නොමැත.

ඉඩම් සඳහා ඔප්පු ලබාදීමේ වැදගත්කම පිළිබඳව මෑතකාලීනව බෙහෙවින් අවධාරණය කරන බවක් පෙනෙන්නට ඇති නමුත් මෙය ද ඉඩම් යනු පරිහරණයෙන් වටිනාකම් ලබාගත හැක්කක් නොව හුවමාරුවෙන් වටිනාකම උපරිම කරගත හැකි වෙළඳ භාණ්ඩයක් ලෙස දැකීමේ ආක්‍රමණශීලී නියෝලිබරල්වාදී නැඹුරුව අවබෝධ කරගනිමින් සැලකිල්ලට ගතයුතු කරුණක් වේ. රජය සහ වෙළඳපල මුල්කරගත් ඉඩම් හිමිකම් අහිමිකිරීමේ සහ අවතැන්කිරීමේ ක්‍රියාවලි මගින් ඉඩම් කරා ගොවීන්ට/ ගැමි ජනතාවට, ධීවරයින්ට මෙන්ම නාගරික හා ග්‍රාමීය දුගී ජනතාවට ඇති ප්‍රවේශය මත අහිතකර බලපෑම් එල්ල කරන බව වඩ වඩාත් පැහැදිලිව පෙනෙන්නට ගෙන තිබේ.

රජය සහ පෞද්ගලික ප්‍රාග්ධන මූලාශ්‍ර වැවිලි ආර්ථිකය තුළ ඉඩම්වල පාලනය සඳහා එකිනෙකා සමගින් තරඟ කරන අතරේ ඉඩම් කරා ප්‍රවේශය සම්බන්ධයෙන් මෙන්ම නිවාස සම්බන්ධයෙන් ද කඳුරට දෙමළ ජනතාව සැලකියයුතු මට්ටමක ආන්තිකරණයට ලක්වීමක් පෙන්නුම් කරති. වැවිලිකරයේ උද්ගත වෙමින් පවතින දේශපාලන පාරිසරික අර්බුදයෙන් ද ප්‍රධාන වශයෙන් පීඩා විඳින්නේ මෙම ජනතාව ය. වරින්වර ඇතිවන්නා වූත් බරපතළභාවය ක්‍රමක්‍රමයෙන් වැඩිවන්නාවූත් මාරක නායයාම් මගින් මෙය මනාව අවධාරණය කර පෙන්වයි. මෙම දේශපාලන පාරිසරික අර්බුදයේ තවත් ස්වරූපයක් හඳුනා නොගත් හේතුවක් සහිත නිදන්ගත වකුගඩු රෝගයේ පැතිරීමත් සමගින් හිස ඔසවනු පෙනේ. මෙය විශේෂයෙන්ම මහවැලි කලාපයේ හා ඉන් ඔබ්බට වන ප්‍රදේශවල ව්‍යාප්ත වෙමින් පවතියි. තවද, එමගින් මහා පරිමාණ වාරි සහ ජනපදකරණ යෝජනා ක්‍රමවල පාරිසරික උරුමය පිළිබඳව ද අවධාරණය කරනු ලැබේ. නිදහස ලැබීමෙන් අනතුරුව දියත් කළ ගල් ඔය ව්‍යාපෘතියේ සිටම වාර්ගික ගැටුම සඳහා ද මෙම යෝජනාක්‍රමවල ප්‍රතිඵල බලපෑ බව සඳහන් කෙරේ.